වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය
வர்த்தக, வணிக மற்றும் உணவு பாதுகாப்பு அமைச்சு
MINISTRY OF TRADE, COMMERCE AND FOOD SECURITY

අංක 492, ආර්.ඒ. ද මැල් මාවත , කොළඹ 03. இல 492, ஆர்.ஏ. டி மெல் மாவத்தை கொழும்பு 03. No 492, R.A. De Mel Mawatha, Colombo 03.


මාධ්‍ය නිවේදනය | Press Release

දිනය / திகதி / Date: 2024-06-14

**"ජා-ඇල පොසොන් කලාපය 2024"**

වෙළෙඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍ය නලීන් ප්‍රනාන්දු මැතිතුමාගේ සංකල්පයකට අනුව නලීන් ප්‍රනාන්දු පදනමත්, ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයත් එක්ව සංවිධානය කරනු ලබන "පොසොන් කලාපය 2024" ජූනි 21(පොසොන් පොහෝ දින), 22 හා 23 යන දිනයන්හි දී සවස 6.00 සිට ජා-ඇල, ඒකල නගරයේ පැවැත්වීමට අවශ්‍ය කටයුතු සංවිධානය කර ඇත.

මෙහිදී පාසැල් හා රාජ්‍ය යන අංශයන්ගෙන් විවෘත පහන් කූඩු තරඟයක් පැවැත්වෙන අතර ජයග්‍රාහක ජයග්‍රාහිකාවන්ට හට වටිනා මුදල් ත්‍යාග හා සහතිකපත් ප්‍රදානයක් සිදු කරනු ලබන අතර පහන් කූඩු රැසක් ප්‍රදර්ශනය කරනු ඇත.

**පහන් කූඩු විවෘත අංශය**

ප්‍රථම ස්ථානය සඳහා රුපියල් 100,000.00

දෙවන ස්ථානයට රුපියල් 75,000.00

තුන්වන ස්ථානයට රුපියල් 50,000.00

රුපියල් 10,000.00 බැගින් වන සැනසිලි ත්‍යාග ත්‍යාග 10ක් ප්‍රදානය කිරීමට නියමිතයි.

**පාසැල් අංශයේ පහන් කූඩු තරඟය**

ප්‍රථම ස්ථානය වෙනුවෙන් රුපියල් 25,000.00

දෙවන ස්ථානයට රුපියල් 15,000.00

තුන්වන ස්ථානයට රුපියල් 10,000.00

සහභාගීත්වය වෙනුවෙන් රුපියල් 5000.00 බැගින්වන මුදල් ත්‍යාග ප්‍රදානය සිදු කිරීමට නියමිතයි.

**පොසොන් කලාපයේ විචිත්‍රවත් අංග**

සර්වඥ ධාතු ප්‍රදර්ශනය, අටවිසි බුද්ධ මන්දිර, "සදහම් මහිම" කතාව ඇතුලත් විචිත්‍රවත් තොරණ, පාසැල් හා රාජ්‍ය අංශයේ විවෘත පහන් කූඩු තරඟය හා ප්‍රදර්ශනය, භක්ති ගීත, රූකඩ සංදර්ශන, වීදි නාට්‍ය, මිහින්තලා ආකෘතිය, දන්සැල් ඇතුළුව අක්ෂිදාන සංගමය මඟින් පොරොන්දු පත්‍ර අත්සන් තැබීම ආදී වැඩසටහන් රැසක් මෙම පොසොන් කලාපයේ සංවිධානය කර ඇත.

**ලෝචන රාජපක්ෂ,**
**මාධ්‍ය ලේකම්,**
**වෙළෙඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය**


දුරකථන අංකය / தொலைபேசி இல / Telephone: 011 – 2118667, 011 – 2118669, 011 – 3680752
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2423979
Website: www.trade.gov.lk
Email: info@trademin.gov.lk
ලේකම් / செயலாளர் / Secretary: 011 2314327
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2314328